# විද්‍යාවේදී (වැවිලි කළමනාකරණය) බාහිර උපාධි පාඨමාලාව
# 20 වන කණ්ඩායම (2025 - 2027)
# කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය
# ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය මඟින් පවත්වනු ලබන විද්‍යාවේදී වැවිලි කළමනාකරණය පිළිබඳ බාහිර උපාධි පාඨමාලාවේ විසිවන (20) කණ්ඩායම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**ඇතුළත්වීමේ සුදුසුකම්**

පහත සඳහන් සුදුසුකම්වලින් එකක් සහිත වැවිලි කළමනාකරණ ක්ෂේත්‍රයට හෝ කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ විධායක නිළධාරීන් හෝ වැවිලිකරුවන් හෝ වැවිලි කළමනාකරණ ක්ෂේත්‍රයට හෝ කෘෂිකර්ම ක්ෂේත්‍රයට අදාළ ආයතනවල නිළධාරීන් හට අයදුම් කළ හැකි ය.

අ) ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය මඟින් පවත්වනු ලබන කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ ඩිප්ලෝමාව සහ Modern Agro-Technology ඩිප්ලෝමාව.

හෝ

ආ) ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් අනුමත කරනු ලබන අනෙකුත් කෘෂිකාර්මික අධ්‍යාපන ආයතනයකින් පිරිනමන මාස දොළහකට (12) වඩා වැඩි වෙනත් කෘෂිකර්ම ඩිප්ලෝමාවක් සමඟ වැවිලි කළමනාකරණ ක්ෂේත්‍රයේ හෝ අදාළ ක්ෂේත්‍රයක වසර ක (01) සේවා පළපුරුද්ද සහිත වීම.

හෝ

ඇ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විද්‍යා, ජෛව පද්ධති තාක්ෂණය, කෘෂි විද්‍යා, ගණිත, වාණිජ යන විෂය ධාරා වලින් හෝ කේම්බ්‍රිජ් හෝ එඩෙක්සෙල් උසස් පෙළ විභාගයේ දී එක්වර විෂයයන් තුනක් (03) ක් සමත් වීම සමඟ වැවිලි කළමනාකරණ ක්ෂේත්‍රයේ හෝ අදාළ ක්ෂේත්‍රයක වසර තුනක (03) සේවා පළපුරුද්ද සහිත වීම.

**බඳවා ගැනීමේ පටිපාටිය** : ඇතුළත්වීමේ සුදුසුකම් සපුරාලන ඉල්ලුම්කරුවන් මූලික කෘෂිකර්මය හා ඉංග්‍රීසි භාෂාව ඇතුළත් ලිඛිත යෝගත්‍යා පරීක්ෂණයට ඉදිරිපත්විය යුතුයි. විෂයයන් දෙක සඳහා ම අවම වශයෙන් 40% ලකුණු ලබාගන්නා අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ඉහත ඇගැයීම්වලින් සාර්ථක වන්නාවූ අපේක්ෂයින් පාඨමාලාව සඳහා බඳවාගනු ලැබේ.

**පාඨමාලා අධ්‍යයන කාලය** : අධ්‍යයන වර්ෂ 03 කි (2025– 2027).

**පාඨමාලා මාධ්‍යය** : පාඨමාලාවේ අධ්‍යයන කටයුතු ඉංග්‍රීසි මාධ්‍යයෙන් දුරස්ථ අධ්‍යාපන ක්‍රමය යටතේ පවත්වනු ලැබේ. මුද්‍රිත පාඨමාලා පෙළ පොත් සපයනු ලැබේ.

**පාඨමාලාවේ ගාස්තු** : රු. 300,000/- කි. (ලියාපදිංචි වීමේ දී රු. 100,000/- හා ඉතිරිය වාරික 5 කින් ගෙවිය යුතු ය).

**ශිෂ්‍යත්ව (10) :** තෝරාගත් අපේක්ෂකයින්ගේ මූල්‍ය අවශ්‍යතා, අධ්‍යාපන සුදුසුකම්, සේවා පළපරුද්ද සහ ඒ ආශ්‍රිත වෙනත් සාධක කිහිපයක් පදනම්ව, පාඨමාලා ගාස්තුව බාගිතව ආවරණය වන පරිදි ශිෂ්‍යත්ව දහයහක් (10) පිරිනැමේ.

**පාඨමාලා ආරම්භය** : 2025 ජනවාරි.

**අයදුම් කිරීම** : https://pedmis.wyb.ac.lk/registration හෝ නිළ වෙබ් අඩවිය වන https://xpm.mkd.wyb.ac.lk හෝ https://www.wyb.ac.lk (News & Events) වෙත පිවිසීමෙන් මාර්ග ගත අයදුම්පත පිරවීමට සහ අයදුම් කිරීමට හැකි ය.

අයදුම්පත්‍ර ගාස්තුව වන **රුපියල් 2,000/-ක්** ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ **මහජන බැංකුවේ ගිණුම්** කේතය **0907150124000008** යටතේ බැර කර රිසිට්පත මාර්ගගත අයදුම්පත්‍රය පිරවීමේ දී එයට උඩුගත (***upload***) කළ යුතු ය. මාර්ගගත අයදුම්පත්‍රය පද්ධතිය හරහා යොමු කිරිමේ දී ජනනය වන **PDF** අයදුම්පතේ මුද්‍රණ පිටපතක් සහ රිසිට්පතේ මුල් පිටපත ලිපි කවරයේ වම්පස උඩ කෙළවරේ පාඨමාලාවේ නම සඳහන් කර ලියාපදිංචි කළ තැපෑලෙන් **01.11.2024** වන දිනට ප්‍රථමයෙන් **සහකාර ලේඛකාධිකාරී, කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, මාකඳුර, ගෝනවිල (NWP)** යන ලිපිනයට එවිය යුතු ය.

**අසම්පූර්ණ සහ නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

වැඩිදුර විස්තර සඳහා https://pedmis.wyb.ac.lk/registration වෙත පිවිසෙන්න.

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, කුලියාපිටිය.**